ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

AIIB | ASIAN INFRASTRUCTURE INVESTMENT BANK

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහයවීම - AIIB

නාගරික සංවර්ධන කලාපයේ ප්‍රමුඛ ආයෝජනයක් ලෙස නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේ කොළඹ නගරයේ හා තදසන්න ප්‍රදේශවල නිවාස ඒකක 5,500 ක් ඉදිකිරීම හා ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීම අරභයා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව වෙතින් මුදල් සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් සාකච්ඡා කොට ඇත. මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවන අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

**කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සලකා බැලීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත අවශ්‍ය සුදුසුකම්ලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව | අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|
| **අංක 01 / 2019 දරන කළමනාකරණ චක්‍රලේඛය පරිදි PS-4A මට්ටම** | | | |
| 01 | ව්‍යාපෘති ගණකාධිකාරී | 01 | (පහත 1 හෝ 2)<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>ආදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර නවයක (09) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද<br>02. රජයේ දීප ව්‍යාප්ත සේවාවේ III / II පංතියේ හෝ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම<br>**සමග**<br>III/II පංතියේ තනතුරක අවම වශයෙන් වසර නවයක (09) පළපුරුද්ද<br>★ ව්‍යාපෘතිවල පළපුරුද්ද අමතර වාසියක් වේ. |
| **අංක 01 / 20219 දරන කළමනාකරණ චක්‍රලේඛය පරිදි PS 4C - මට්ටම** | | | |
| 02 | ඉංජිනේරු (විදුලි) | 01 | 01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක (03) පශ්චාත් සුදුසුකමක් පළපුරුද්ද<br>★ ව්‍යාපෘතිවල පළපුරුද්ද අමතර වාසියක් වේ. |
| **අංක 01 / 2019 දරන කළමනාකරණ චක්‍රලේඛය පරිදි PS-6A මට්ටම** | | | |
| 03 | සහකාර සමාජ විද්‍යාඥ | 03 | (පහත 1 හෝ 2 හෝ 3)<br>01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම<br>**හෝ**<br>තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටම (NVQ Level 7) නොඅඩු කාර්ය සාධන සහතිකයක් ලබා තිබීම<br>**සමග**<br>විශේෂතාවය අවශ්‍ය විෂය පථයේ අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්ද<br>02. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට (NVQ Level 6) නොඅඩු කාර්ය සාධන සහතිකයක් ලබා තිබීම<br>**සමග**<br>විශේෂතාවය අවශ්‍ය විෂය පථයේ අවම වශයෙන් වසර නවයක (09) පළපුරුද්ද<br>03. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට (NVQ Level 5) නොඅඩු කාර්ය සාධන සහතිකයක් ලබා තිබීම<br>**සමග**<br>විශේෂතාවය අවශ්‍ය විෂය පථයේ අවම වශයෙන් වසර දහතරක (14) පළපුරුද්ද |
| **අංක 01 / 2019 දරන කළමනාකරණ චක්‍රලේඛය පරිදි PS-6B මට්ටම** | | | |
| 04 | තාක්ෂණ නිලධාරී (විදුලි) | 01 | (පහත 1 හෝ 2 හෝ 3)<br>01. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට (NVQ Level 7) නොඅඩු කාර්ය සාධන සහතිකයක් ලබා තිබීම<br>**සමග**<br>විශේෂතාවය අවශ්‍ය විෂය පථයේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද<br>02. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනලද ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට (NVQ Level 6) නොඅඩු කාර්ය සාධන සහතිකයක් ලබා තිබීම<br>**සමග**<br>විශේෂතාවය අවශ්‍ය විෂය පථයේ අවම වශයෙන් වසර හතක (07) පළපුරුද්ද<br>03. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනලද ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට (NVQ Level 5) නොඅඩු කාර්ය සාධන සහතිකයක් ලබා තිබීම<br>**සමග**<br>විශේෂතාවය අවශ්‍ය විෂය පථයේ අවම වශයෙන් වසර දෙළහක (12) පළපුරුද්ද |
| 05 | තාක්ෂණ නිලධාරී (සේවා) | | |
| **අංක 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛය පරිදි ආධාරක කාර්ය මණ්ඩලය රජයේ සේවය හා දීමනා** | | | |
| 06 | පරිගණක ක්‍රියාකරු | 02 | (පහත 1 හෝ 2 හෝ 3)<br>01. භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව සම්මාන 05 ක් සහිතව විෂයන් 6 න් එක්වර අ.පො.ස. (සා/පෙ) විභාගය සමත් වී තිබීම<br>**හෝ**<br>02. ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමේ (NVQ Level) පරිගණක / තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හදරා තිබීම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉහත සුදුසුකමකට සමාන සුදුසුකමක්<br>**හෝ**<br>03. MS Word / Excel / Power Point පිළිබඳ උසස් සාක්ෂරතාව සහ ඉංග්‍රීසි හා සිංහල යතුරු ලියනය<br>**සමග**<br>පරිගණක ක්‍රියාකරුවෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද |

**නියමයන් හා කොන්දේසි :**

වැටුප්, නියමයන් හා කොන්දේසි 2019.03.15 දතම අංක 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛය පරිදි වේ. සේවා ස්ථානය කොළඹ වන අතර බස්නාහිර පළාත තුළ ක්ෂේත්‍ර ගමන් ඇතුළත්වේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම**

www.moudh.gov.lk සහ www.uda.gov.lk යන වෙබ් අඩවිවල ලබා දී ඇති අයදුම්පත අනුගමනය කරන මෙන් අයදුම්කරුවන්ට අවවාද කෙරේ.

අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද අඩංගු ජීව දත්ත ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහිතව 2022.02.17 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් පහත ලිපිනයට එවන මෙන් අයදුම්කරුවන්ට අවවාද කෙරේ. අදාළ සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය (AIIB),**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**5 වන මහල,**
**සෙත්සිරිපාය,**
**අදියර 1, බත්තරමුල්ල.**

අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර කරුණාකර සඳහන් කරන්න.

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, නිසි වේලාවට අයදුම්පත ලැබීම තහවුරු කිරීම සඳහා පිටපතක් කෙළින්ම යොමු කරන මෙන් අවවාද කෙරේ.

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් සම්මුඛ පරීක්ෂණය සඳහා සලකා බලනු නොලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය (AIIB),**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**5 වන මහල, සෙත්සිරිපාය, අදියර 1 - බත්තරමුල්ල.**
**2022 ජනවාරි 31**